(දසවැනි පාර්ලිමේන්තුව - පළමුවැනි සභාවාරය)

අංක 23. ]

# පාර්ලිමේන්තුවේ කාර්ය සටහන්

**2025 පෙබරවාරි 20 බ්‍රහස්පතින්දා පූ.භා. 9.30 ට**

## පැමිණි මන්ත්‍රීන් :

ගරු **(වෛද්‍ය) ජගත් වික්‍රමරත්න මහතා,** කථානායකතුමා

ගරු **(වෛද්‍ය) රිස්වි සාලි මහතා,** නියෝජ්‍ය කථානායකතුමා සහ කාරක සභා සභාපතිතුමා

ගරු **හේමාලි වීරසේකර මහත්මිය,** නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය

---

ගරු **ආචාර්ය හරිනි අමරසූරිය,** අග්‍රාමාත්‍යතුමිය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමිය

ගරු **(මහාචාර්ය) ඒ.එච්.එම්.එච්. අබයරත්න මහතා,** රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යතුමා

ගරු **ක්‍රිෂාන්ත අබේසේන මහතා,** විද්‍යා හා තාක්ෂණ අමාත්‍යතුමා

ගරු **අනුර කරුණාතිලක මහතා,** නාගරික සංවර්ධන, ඉදිකිරීම් සහ නිවාස අමාත්‍යතුමා

ගරු **කේ. ඩී. ලාල් කාන්ත මහතා,** කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමා

ගරු **රාමලිංගම් චන්ද්‍රසේකර් මහතා,** ධීවර, ජලජ සහ සාගර සම්පත් අමාත්‍යතුමා

ගරු **(වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා,** සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යතුමා සහ ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමා

ගරු **නීතිඥ හර්ෂණ නානායක්කාර මහතා,** අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යතුමා

ගරු **(වෛද්‍ය) දම්මික පටබැඳි මහතා,** පරිසර අමාත්‍යතුමා

ගරු **බිමල් රත්නායක මහතා,** ප්‍රවාහන, මහාමාර්ග, වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමා සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා

ගරු **ආනන්ද විජේපාල මහතා,** මහජන ආරක්ෂක සහ පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යතුමා

ගරු **කේ. වී. සමන්ත විද්‍යාරත්න මහතා,** වැවිලි සහ ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යතුමා

ගරු **වසන්ත සමරසිංහ මහතා,** වෙළෙඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමූපකාර සංවර්ධන අමාත්‍යතුමා

ගරු **(ආචාර්ය) හිනිදුම සුනිල් සෙනෙවි මහතා,** බුද්ධශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා

ගරු **සුනිල් හඳුන්නෙත්ති මහතා,** කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යතුමා

ගරු **සජිත් ප්‍රේමදාස මහතා,** පාර්ලිමේන්තුවේ විරුද්ධ පාර්ශ්වයේ නායකතුමා

ගරු **චතුරංග අබේසිංහ මහතා,** කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **නාමල් කරුණාරත්න මහතා,** කෘෂිකර්ම සහ පශු සම්පත් නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **ජනිත රුවන් කොඩිතුවක්කු මහතා,** වරාය සහ සිවිල් ගුවන් සේවා නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **රත්න ගමගේ මහතා,** ධීවර, ජලජ සහ සාගර සම්පත් නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **එරංග ගුණසේකර මහතා,** තරුණ කටයුතු නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **ඇන්ටන් ජයකොඩි මහතා,** පරිසර නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **ආර්. එම්. ජයවර්ධන මහතා,** වෙළෙඳ, වාණිජ සහ ආහාර සුරක්ෂිතතා නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **මහින්ද ජයසිංහ මහතා,** කම්කරු නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **මේජර් ජෙනරාල් (විශ්‍රාමික) අරුණ ජයසේකර මහතා,** ආරක්ෂක නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **වසන්ත පියතිස්ස මහතා,** ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබලගැන්වීමේ නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **මුනීර් මුලාෆර් මහතා,** ජාතික ඒකාබද්ධතා නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **නීතිඥ සුනිල් වටගල මහතා,** මහජන ආරක්ෂක සහ පාර්ලිමේන්තු කටයුතු නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **එරංග වීරරත්න මහතා,** ඩිජිටල් ආර්ථික නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **ටී. බී. සරත් මහතා,** නිවාස නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **(වෛද්‍ය) නාමල් සුදර්ශන මහතා,** කාන්තා සහ ළමා කටයුතු නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **(ආචාර්ය) හර්ෂණ සූරියප්පෙරුම මහතා,** මුදල් සහ ක්‍රම සම්පාදන නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **පී. රුවන් සෙනරත් මහතා,** පළාත් සභා සහ පළාත් පාලන නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **අරුන් හේමචන්ද්‍ර මහතා,** විදේශ කටයුතු සහ විදේශ රැකියා නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **නලින් හේවගේ මහතා,** වෘත්තීය අධ්‍යාපන නියෝජ්‍ය අමාත්‍යතුමා

---

ගරු **අජිත් අගලකඩ මහතා**

ගරු **අමිර්තනාදන් අඩෛක්කලනාදන් මහතා**

ගරු  අබූබකර් අතම්බාවා මහතා

ගරු  හෙක්ටර් අප්පුහාමි මහතා

ගරු  රෝහිත අබේගුණවර්ධන මහතා

ගරු  නීතිඥ යූ. පී. අබේවික්‍රම මහතා

ගරු  (වෛද්‍ය) රාමනාදන් අර්චුනා මහතා

ගරු  ජේ. සී. අලවතුවල මහතා

ගරු  එම්. කේ. එම්. අස්ලම් මහතා

ගරු  හේෂා විතානගේ අංකුඹුර ආරච්චි මහතා

ගරු  (ආචාර්ය) කෞෂල්‍යා ආරියරත්න මෙනෙවිය

ගරු  බී. ආරියවංශ මහතා

ගරු  (වෛද්‍ය) නජිත් ඉන්දික මහතා

ගරු  අර්කම් ඉල්යාස් මහතා

ගරු  එම්. එස්. උදුමාලෙබ්බේ මහතා

ගරු  ඔෂානි උමංගා මහත්මිය

ගරු  ගයන්ත කරුණාතිලක මහතා

ගරු  රවී කරුණානායක මහතා

ගරු  නීතිඥ චමින්ද්‍රාණී කිරිඇල්ල මහත්මිය

ගරු  කදිරවේලු ෂන්මුගම් කුගදාසන් මහතා

ගරු  වසන්ත පුෂ්ප කුමාර මහතා

ගරු  නීතිඥ සරත් කුමාර මහතා

ගරු  නීතිඥ නිලන්ති කොට්ටහච්චි මහත්මිය

ගරු  කවීන්දිරන් කෝඩීස්වරන් මහතා

ගරු  ලසිත් භාෂණ ගමගේ මහතා

ගරු  චතුර ගලප්පත්ති මහතා

ගරු  අජිත් ගිහාන් මහතා

ගරු  (වෛද්‍ය) ජගත් ගුණවර්ධන මහතා

ගරු  සමන්මලී ගුණසිංහ මහත්මිය

ගරු  අශෝක ගුණසේන මහතා

ගරු  ඩී. වී. චානක මහතා

ගරු  ගයාන් ජනක මහතා

ගරු  අනුරාධ ජයරත්න මහතා

ගරු  (වෛද්‍ය) කවින්ද හේෂාන් ජයවර්ධන මහතා

ගරු දිලිත් ජයවීර මහතා

ගරු කෝසල නුවන් ජයවීර මහතා

ගරු ටී. කේ. ජයසුන්දර මහතා

ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා

ගරු මයිල්වාගනම් ජෙගදීස්වරන් මහතා

ගරු රජීවන් ජෙයචන්ද්‍රමූර්ති මහතා

ගරු එම්. ඒ. එම්. තාහිර් මහතා

ගරු (වෛද්‍ය) සෙල්ලතම්බි තිලකනාදන් මහතා

ගරු සුගත් වසන්ත ද සිල්වා මහතා

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා

ගරු නීතිඥ සුසන්ත දොඩාවත්ත මහතා

ගරු ඩබ්ලිව්. එච්. එම්. ධර්මසේන මහතා

ගරු මොහමඩ් සාලි නලීම් මහතා

ගරු සුසන්ත කුමාර නවරත්න මහතා

ගරු (මහාචාර්ය) සේන නානායක්කාර මහතා

ගරු කිංස් නෙල්සන් මහතා

ගරු නිමල් පලිහේන මහතා

ගරු නිශාන්ත පෙරේරා මහතා

ගරු අජිත් පී. පෙරේරා මහතා

ගරු කේ. සුජිත් සංජය පෙරේරා මහතා

ගරු ජී. ජී. පොන්නම්බලම් මහතා

ගරු නීතිඥ චිත්‍රාල් ප්‍රනාන්දු මහතා

ගරු ස්ටෙෆනි ප්‍රනාන්දු මහතා

ගරු කන්දසාමි ප්‍රභු මහතා

ගරු ලාල් ප්‍රේමනාත් මහතා

ගරු රෝහණ බංඩාර මහතා

ගරු නන්ද බණ්ඩාර මහතා

ගරු පද්මසිරි බණ්ඩාර මහතා

ගරු ආර්. එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා

ගරු රවීන්ද්‍ර බණ්ඩාර මහතා

ගරු රිසාඩ් බදියුදීන් මහතා

ගරු (වෛද්‍ය) එස්. ශ්‍රී බවානන්දරාජා මහතා

ගරු විජේසිරි බස්නායක මහතා

ගරු ලුතිනන් කොමාණ්ඩර් (විශ්‍රාමික) ප්‍රගීත් මධුරංග මහතා

ගරු ජගත් මනුවර්ණ මහතා

ගරු එස්. එම්. මරික්කාර් මහතා

ගරු ඉම්රාන් මහරූෆ් මහතා

ගරු චානක මාදුගොඩ මහතා

ගරු රුවන් මාපලගම මහතා

ගරු (ආචාර්ය) නන්දන මිල්ලගල මහතා

ගරු ඉස්මායිල් මුත්තු මොහොමඩ් මහතා

ගරු ධනුෂ්ක රංගනාත් මහතා

ගරු සංජීව රණසිංහ මහතා

ගරු සුනිල් රත්නසිරි මහතා

ගරු ආර්. එම්. ගාමිණී රත්නායක මහතා

ගරු සුරංග රත්නායක මහතා

ගරු තුරෛරාසා රවිකරන් මහතා

ගරු මුජිබුර් රහුමාන් මහතා

ගරු හර්ෂණ රාජකරුණා මහතා

ගරු සුනිල් රාජපක්ෂ මහතා

ගරු (ආචාර්ය) වී. එස්. රාධක්‍රිෂ්ණන් මහතා

ගරු ෂානක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා

ගරු වරුණ ලියනගේ මහතා

ගරු නීතිඥ හසාරා ලියනගේ මහත්මිය

ගරු දීප්ති වාසලගේ මහත්මිය

ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය

ගරු ආර්. ජී. විජේරත්න මහතා

ගරු නීතිඥ ප්‍රියන්ත විජේරත්න මහතා

ගරු රුවන් විජේවීර මහතා

ගරු ධර්මප්‍රිය විජේසිංහ මහතා

ගරු අසිත නිරෝෂණ එගොඩ විතාන මහතා

ගරු දිලිප් වෙදආරච්චි මහතා

ගරු අතුල වෙළඳගොඩ මහතා

ගරු ඥානමුත්තු ශ්‍රීනේසන් මහතා

**ගරු ෆස්මින් ෂරීෆ් මහතා**

**ගරු (වෛද්‍ය) පත්මනාදන් සත්‍යලිංගම් මහතා**

**ගරු දිනිඳු සමන් මහතා**

**ගරු තිළිණ සමරකෝන් මහතා**

**ගරු (වෛද්‍ය) නිශාන්ත සමරවීර මහතා**

**ගරු අම්බිකා සාමිවෙල් මෙනෙවිය**

**ගරු (වෛද්‍ය) ඉලෙයියතම්බි සිරිනාත් මහතා**

**ගරු දේවානන්ද සුරවීර මහතා**

**ගරු චන්දන සූරියආරච්චි මහතා**

**ගරු මේජර් ජෙනරාල් (විශ්‍රාමික) ජී. ඩී. සූරියබණ්ඩාර මහතා**

**ගරු අරවින්ද සෙනරත් මහතා**

**ගරු නීතිඥ අර්ජුන සුජීව සේනසිංහ මහතා**

**ගරු (වෛද්‍ය) ජනක සේනාරත්න මහතා**

**ගරු නීතිඥ රවුෆ් හකීම් මහතා**

**ගරු කබීර් හෂීම් මහතා**

**ගරු චන්දිම හෙට්ටිආරච්චි මහතා**

**ගරු චම්පික හෙට්ටිආරච්චි මහතා**

**ගරු නීතිඥ ලක්මාලි හේමචන්ද්‍ර මෙනෙවිය**

කුෂානි රෝහණදීර මහත්මිය, පාර්ලිමේන්තුවේ මහ ලේකම්

චමින්ද කුලරත්න මහතා, කාර්ය මණ්ඩල ප්‍රධානී සහ පාර්ලිමේන්තුවේ නියෝජ්‍ය මහ ලේකම්

හංස අබේරත්න මහතා, සහකාර මහ ලේකම්

**කල් තැබීම අනුව පාර්ලිමේන්තුව රැස් විය. කථානායකවරයා මූලාසනාරූඪ විය.**

**1. ලිපිලේඛනාදිය පිළිගැන්වීම:** (1) අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යවරිය විසින් 2024 පළමු, දෙවන සහ තෙවන කාර්තු සඳහා අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ කාර්ය සාධන වාර්තා ඉදිරිපත් කර, එම වාර්තා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා කටයුතු පිළිබඳ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(2) අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යවරිය විසින් 2017 අංක 24 දරන දේශීය ආදායම් පනතේ 75(1) වගන්තිය යටතේ ද්විත්ව බදුකරණය වැළැක්වීම සහ ආදායම් මත බදු ගෙවීම පැහැර හැරීම වැළැක්වීම සම්බන්ධයෙන් 2013 ජූලි 26 දින පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලදුව, 2013 සැප්තැම්බර් 17 දිනැති අංක 1828/9 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුව සහ ඉන්දීය ජනරජයේ ආණ්ඩුව අතර එළඹී ගිවිසුම සංශෝධනය කරමින් 2024 දෙසැම්බර් 16 දින ඇති කරගත් සන්ධාන පත්‍රය ඉදිරිපත් කර, එම සන්ධාන පත්‍රය රජයේ මුදල් පිළිබඳ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(3) වැවිලි සහ ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යවරයා විසින් 2022/2023 වර්ෂය සඳහා සීමාසහිත කළුබෝවිටියාන තේ කර්මාන්තශාලා සමාගමේ වාර්ෂික වාර්තාව ඉදිරිපත් කර, එම වාර්තාව වැවිලි සහ ප්‍රජා යටිතල පහසුකම් කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(4) මහජන ආරක්ෂක සහ පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යවරයා විසින් රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලද වාර්තාවේ මහජන ආරක්ෂක අමාත්‍යාංශය සහ ඒ යටතේ පවතින ආයතන සම්බන්ධ කරුණු පිළිබඳව පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 119(4) ප්‍රකාරව, නිරීක්ෂණ සහ ගනු ලැබූ ක්‍රියාමාර්ග පිළිබඳ වාර්තා ඉදිරිපත් කර, එම වාර්තාව රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

**2. මහජන පෙත්සම් පිළිගැන්වීම:**

(1) (i) බදුල්ල, මයිලගස්තැන්න, දළදා ඇල පාර, අංක 40/8 දරන ස්ථානයෙහි පදිංචි ඒ. පී. රාජසූරිය මහතාගෙන් ලැබුණු 2024.12.28 දිනැති පෙත්සම; සහ

(ii) හාලිඇල, බෝගහමඩිත්ත, බෝ සෙවන යන ලිපිනයෙහි පදිංචි ආර්. එම්. හේමචන්ද්‍ර බණ්ඩාර මහතාගෙන් ලැබුණු 2024.11.29 දිනැති පෙත්සම

ගරු කේ. වී. සමන්ත විද්‍යාරත්න මහතා විසින් පිළිගන්වන ලදී.

(2) (i) මාපලගම - මධ්‍යම, අළුත් ඉහළ, දෙහැත්තගෙවත්ත යන ලිපිනයෙහි පදිංචි ආරියදාස ගොඩගම මහතාගෙන් ලැබුණු 2024.12.06 දිනැති පෙත්සම;

(ii) ඌරගස්මංහන්දිය, අඹගහහන්දිය, වල්ඉහුරුකැටිය පාර, 'රංගවිලා' යන ලිපිනයෙහි පදිංචි කේ. ඒ. තාබ්‍රෙව් මහතාගෙන් ලැබුණු 2024.11.28 දිනැති පෙත්සම; සහ

(iii) පිළිමතලාව, ගඩලාදෙණිය, අංක 333 දරන ස්ථානයෙහි පදිංචි කේ. ජී. සෙනවිරත්න මහතාගෙන් ලැබුණු 2024.12.11 දිනැති පෙත්සම

ගරු ගයන්ත කරුණාතිලක මහතා විසින් පිළිගන්වන ලදී.

(3) (i) ගම්පහ, වලව්වත්ත, අංක 313/54 දරන ස්ථානයෙහි පදිංචි ඒ. ඒ. එස්. කෞෂල්‍යා මහත්මියගෙන් ලැබුණු 2025.01.23 දිනැති පෙත්සම;

(ii) ගම්පහ, මොරගොඩ, අංක 19 ඒ දරන ස්ථානයෙහි පදිංචි එච්. එච්. පාලිත ධනපාල මහතාගෙන් ලැබුණු 2024.12.10 දිනැති පෙත්සම;

(iii) ගම්පහ, මුදුන්ගොඩ, හෙනරත්ගොඩ, අංක 165 දරන ස්ථානයෙහි පදිංචි කේ. ඒ. ජේ. අබේසිංහ මහතාගෙන් ලැබුණු 2025.01.03 දිනැති පෙත්සම;

(iv) ඇල්ලගාව, මඩල, ජයවර්ධන මාවත, අංක 220 දරන ස්ථානයෙහි පදිංචි කේ. වී. අනුරකීර්ති මහතාගෙන් ලැබුණු 2024.11.22 දිනැති පෙත්සම;

(v) කිරිදිවැල, කුට්ටිවිල, අංක 203 දරන ස්ථානයෙහි පදිංචි පී. පී. සරත් රාජපක්ෂ මහතාගෙන් ලැබුණු 2025.01.06 දිනැති පෙත්සම;

(vi) ගනේමුල්ල, කොස්සින්න, අංක 281/සී දරන ස්ථානයෙහි පදිංචි සංජය හේවා බඹරැන්දගේ මහතාගෙන් ලැබුණු 2024.12.11 දිනැති පෙත්සම; සහ

(vii) ඉඹුල්ගොඩ, පහළ යාගොඩ, දඹුවත්ත, අංක 11 දරන ස්ථානයෙහි පදිංචි ඩබ්ලිව්. ජේ. පී. සී. යූ. විජයතුංග මහතාගෙන් ලැබුණු 2025.01.06 දිනැති පෙත්සම

ගරු ලසිත් භාෂණ ගමගේ මහතා විසින් පිළිගන්වන ලදී.

(4) (i) ගන්දර, තලල්ල දකුණ, වලේ වත්තේ යන ලිපිනයෙහි පදිංචි එච්. එම්. නිලූකා සාමලී හේරත් මහත්මියගෙන් ලැබුණු 2025.01.08 දිනැති පෙත්සම;

(ii) වැලිගම, කොක්මාදුව, ගොරකගහ කොරටුව යන ලිපිනයෙහි පදිංචි කේ. එල්. සී. නිශාන්ත මහතාගෙන් ලැබුණු 2025.01.18 දිනැති පෙත්සම;

(iii) බඩල්ගම, නැගෙනහිර ගොඩිගමුව, ගමගේ වත්ත, අංක 84 ඒ දරන ස්ථානයෙහි පදිංචි පී. සංජීව ප්‍රසාද් ප්‍රනාන්දු මහතාගෙන් ලැබුණු 2024.12.17 දිනැති පෙත්සම;

(iv) තිස්සමහාරාම, දෙබරවැව, ගහසිරිපුර, අංක 499 දරන ස්ථානයෙහි පදිංචි පී. එම්. ජයන්ත මහතාගෙන් ලැබුණු 2025.01.18 දිනැති පෙත්සම; සහ

(v) කුරුණෑගල, මීගමු පාර, කප්රුකවත්ත, අලකොලදෙණිය, අංක 12 දරන ස්ථානයෙහි පදිංචි එස්. එම්. පියතිස්ස මහතාගෙන් ලැබුණු 2024.12.17 දිනැති පෙත්සම

ගරු චතුර ගලප්පත්ති මහතා විසින් පිළිගන්වන ලදී.

(5) වෙල්පල්ල, ගණන්කැටේ යන ලිපිනයෙහි පදිංචි එච්. ඩී. රන්ජන් මහතාගෙන් ලැබුණු 2024.11.11 දිනැති පෙත්සම ගරු (වෛද්‍ය) ජගත් ගුණවර්ධන මහතා විසින් පිළිගන්වන ලදී.

(6) දෙහිඕවිට, අල්ගොඩ, දෙහිඕවිට කෝප් සිටිය බාරේ, දැහැමි සෙවන, අංක ඒ 58/2 දරන ස්ථානයෙහි පදිංචි ඩබ්ලිව්. ජයන්ත වීරසිරි මහතාගෙන් ලැබුණු 2024.11.30 දිනැති පෙත්සම ගරු කෝසල නුවන් ජයවීර මහතා විසින් පිළිගන්වන ලදී.

(7) වැලිගම, හල්ලල, හේනවත්ත යන ලිපිනයෙහි පදිංචි සරත් හේවාපතිරණ මහතාගෙන් ලැබුණු 2024.12.25 දිනැති පෙත්සම ගරු ලාල් ප්‍රේමනාත් මහතා විසින් පිළිගන්වන ලදී.

(8) අහුන්ගල්ල, හෝටල් පාර, සිරිසෙවන යන ලිපිනයෙහි පදිංචි පී. ජී. ද සිල්වා මහතාගෙන් ලැබුණු 2024.11.26 දිනැති පෙත්සම ගරු නීතිඥ හසාරා ලියනගේ මහත්මිය විසින් පිළිගන්වන ලදී.

(9) කුලියාපිටිය, අනුක්කනේ, බෝධිමුල්ල, නෙත්මිණි උයන, අංක 270/8 ඒ දරන ස්ථානයෙහි පදිංචි එච්. එල්. සමන්ත කුමාර මහතාගෙන් ලැබුණු 2024.12.01 දිනැති පෙත්සම ගරු මේජර් ජෙනරාල් (විශ්‍රාමික) ජී. ඩී. සූරියබණ්ඩාර මහතා විසින් පිළිගන්වන ලදී.

30(10) දරන පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝගය යටතේ එම පෙත්සම්, මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවට යොමු කරන ලදී.

**3. විසර්ජන පනත් කෙටුම්පත — (තෙවැනි වෙන් කළ දිනය):** කල් තබන ලද විවාදය තවදුරටත් පවත්වනු පිණිස නියෝගය කියවන ලදී. ඊට අදාළ ප්‍රශ්නය (2025 පෙබරවාරි 17),—

"පනත් කෙටුම්පත දැන් දෙවැනි වර කියවිය යුතු ය" යි ප්‍රශ්නය යළිත් සභාභිමුඛ කරන ලදින්, විවාදය තවදුරටත් පවත්වන ලදී.

(පූ.භා. 10.47ට නියෝජ්‍ය කාරක සභා සභාපතිවරිය මූලාසනාරූඪ විය.)

(පූ.භා. 11.52 ට නියෝජ්‍ය කථානායකවරයා මූලාසනාරූඪ විය.)

(අ.භා. 1.00 ට නියෝජ්‍ය කථානායකවරයා මූලාසනාරූඪ විය.)

(අ.භා. 2.42 ට නියෝජ්‍ය කාරක සභා සභාපතිවරිය මූලාසනාරූඪ විය.)

"ගරු අරවින්ද සෙනරත් මහතා මූලාසනාරූඪ විය යුතු ය"යි ධීවර, ජලජ සහ සාගර සම්පත් අමාත්‍යවරයා විසින් යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(අ.භා. 4.20 ට ගරු අරවින්ද සෙනරත් මහතා මූලාසනාරූඪ විය.)

එකල්හි වේලාව අ.භා. 6.00 වූයෙන්, විවාදය කල් ගියේ ය; එතැන් සිට විවාදය 2025 පෙබරවාරි 21 සිකුරාදා පවත්වනු ලැබේ.

**4. කල් තැබීම (අම්පාර පෙරිය නිලාවනෙයි ප්‍රදේශයේ යෝජිත සුරාසල් සඳහා නිකුත් කරන ලද බලපත්‍ර අත්හිටුවීම):** "මෙම පාර්ලිමේන්තුව දැන් කල් තැබිය යුතු ය" යි වැවිලි සහ ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යවරයා විසින් යෝජනා කරන ලදී.

ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදින්, විවාද විය.

එකල්හි වේලාව අ.භා. 6.30 වූයෙන්, මූලාසනාරූඪ මන්ත්‍රීවරයා විසින් ප්‍රශ්නය නොවිමසා පාර්ලිමේන්තුව කල් තබන ලදී.

ඊට අනුකූලව, පාර්ලිමේන්තුව 2025 පෙබරවාරි 06 සභා සම්මතිය අනුව, 2025 පෙබරවාරි 21 සිකුරාදා පූ.භා. 9.30 වනතෙක් කල් ගියේ ය.